ලිතිර ප්‍රකාශන පෞද්ගලික සමාගම,
98, වෝඩ් පෙදෙස, කොළඹ 07.
ප්‍රධාන කර්තෘ: 011 - 5 - 344202
කර්තෘ මණ්ඩලය : 011 - 5 - 344203/4
දැන්වීම් අංශය : 011 - 5 - 344205
බෙදාහැරීම් අංශය : 011 - 5 - 365895
ෆැක්ස්: 011 - 5 - 344200
ඊ මේල්: editor@irudina.lk
වෙබ් අඩවිය: www.irudina.lk

# පොලිසිය පොලිෂ් කිරීම

නීතිය ඉදිරියේ කිසිවකුගේ උස් මිටිකම් ගණන් නොගැනේ යන කියමන යුක්තිය සාධාරණත්වය ගැන කතා කරන හැමවිටම මතකයට නැගේ. නීතියේ දෙවඟනගේ. ඇස් බැඳ තුලාව අතට දී ඇත්තේ උස්මිටිකම් නොබලා යුක්තිය ඉෂ්ට කරනු පිණිස ය. එහෙත් අද අපේ රට පත්වී ඇත්තේ එවන් යුක්තිගරුක සාධාරණ තත්ත්වයකට බව කිව හැකිද?

බලය හමුවේ නීතිය පවා වකුටු වන තත්ත්වයක් දැන් දැන් පෙනෙන්නට පටන්ගෙන තිබේ. මාර්ග නීතියක් කඩ කරන ත්‍රිරෝද රථ රියැදුරෙකුට හෝ බස් රථ රියැදුරෙකුට හිටිවනම දඩ කොල ලියන තරමට විනයගරුක පොලිසිය තමන්ගේ අතට අසුවන තෝරුන් මෝරුන් බේරා ඇරීමට දරන තැත ලැජ්ජාසහගත බව කිව යුතු ය. පොලිසියේ කල්ක්‍රියාවන් ගැන කතා කරන බොහෝ විට ඒ නරක නාමය පහළ සුළු පොලිස් මුලාදැනින් වෙත පවරා පොලිස් ලොක්කන් අත සෝදාගෙන පිරිසිදු වන හැටි බොහෝ දෙනාට හුරුපුරුදු ය. එවැනි විටෙක ඉහළ පොලිස් ලොක්කන්ට ඒ පැමිණිල්ල ඉදිරිපත් කර යුක්තිය ඉෂ්ට කරවා ගැනීමට පුළුවනැයි හුදී ජනයාට බලාපොරොත්තු තබාගත හැකිය. එහෙත් අදෝමැයි!

අද ඇස් පනාපිට පෙනෙන්නේ පොලිසියේ ඉහළම තලය නීතිය ඉටු කිරීමට දක්වන පසුබෑමයි.

විදේශ සබඳතා හා කම්කරු නියෝජ්‍ය ඇමති මර්වින් සිල්වාගේ පුත් මාලක සිල්වාගේ නොපනත් ක්‍රියා පිළිබඳ මීට පෙර ද විටින් විට වාර්තා විය. රෑ තිස්සේ සමාජ ශාලාවලට වැදී මත් ද්‍රව්‍ය ගන්නා ඇතැම් තරුණයෝ අවට සිටින රාජකාරියේ යෙදෙන පොලිසියේ හෝ ආරක්ෂක සේවයේ යෙදෙන පුද්ගලයන් කට ගැස්මට ගන්නට තැත් කරන හැටි නිතර අසන්නට ලැබෙයි. එහෙත් ඒ සාමාන්‍ය සිද්ධියකට වඩා මේ ඇමති පුතුන් කරන ක්‍රියා බරපතළ ය. ඇමතිවරුන්ට දී ඇති ආරක්ෂකයන් ද ඇමතිවරුන් රැකීමට දී ඇති ගිනි අවි ද රැගෙන රාත්‍රී සමාජශාලාවලට යන උමතු ඇමති පුතුන් ආරක්ෂා කිරීමත්, ජනතාව විසින් දී ඇති බලතල සාවද්‍ය ලෙස පරිහරණය කිරීමක් නොවේද?

මත්ද්‍රව්‍ය නාශක අංශයේ පොලිස් නිලධාරීන් නීත්‍යනුකූලව උසාවි නියෝගයක් ලබාගෙන නීතිමය රෙගුලාසිවලට පටහැනිව පවත්වාගෙන යන රාත්‍රි සමාජ ශාලා වැටලීමට ගිය අවස්ථාවකදී නියෝජ්‍ය ඇමති මර්වින් සිල්වාගේ පුත් මාලක සිල්වා පොලිස් නිලධාරීන්ට අසභ්‍ය වචනයෙන් බැණ වැදී තර්ජනය සිදු කිරීම පමණක් නොවේ. ඔවුන්ට ගිනි අවි පෙන්වා බියගැන්වීමත් තොල් පලා තුවාල සිදු කිරීමත් සැහැල්ලුවට ගත හැකිද? තරුණ මදයන් මත් වූ පමණින් ද ඇමති බලයෙන් මත් වූ පමණින් ද ඔවුනට පොලිසියේ රාජකාරියට බාධා කිරීමේ බලපත්‍රයක් ලැබේද?

කලකට පෙර මේ පුත්‍රයාගේම මෙවැනි අවකල් ක්‍රියාවක් නිසා මර්වින් සිල්වාට සිය නියෝජ්‍ය ඇමති පදවියෙන් ඉල්ලා අස්වීමට සිදුවිය. ඉන්පසු ඇමතිකම් නැතිව සිටිය දී ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි යෙදුණු බවට වාර්තා නොවූ මාලක සිල්වා යළි මෙසේ කල එළියට එන්නේ සිය පියා නැවත නියෝජ්‍ය ඇමති පදවියේ දිවුරුම් දෙනවාත් සමග වීම පුදුම සහගත ය. ඉන් පෙනෙන්නේ මාලක සිල්වාගේ මේ කල්ක්‍රියාවන් සිය පියාගේ තනතුරු ලැබීමත් සමග මතුවන බවකි.

රෑ තිස්සේ පියාගේ ආරක්ෂකයන් සමග සමාජ ශාලාවලට යන තරුණයන් යහ මඟට ගත හැක්කේ පතින රිලවුන්ට ඉනිමං තබන ආකාරයෙන් වැඩිහිටියන් ක්‍රියාකිරීමෙන් නොවේ. ඔවුන්ට වැරදි පෙන්නා දීමෙනි. ඔවුන්ට තරවටු කිරීමෙනි.

වරෙක දුටුගැමුණු වීමට හදන වරෙක නෙල්සන් මැන්ඩෙලා වීමට හදන තවත් වරෙක වීරෝදාර රුහුණු පුත්‍රයෙකු වීමට හදන ඔහු මේ සියලු විරුවන්ටත් රුහුණු පුත්‍රයන්ටත් පමණක් නොව ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ තමන්ට ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීකම් දී ඉන් නොනැවතී නියෝජ්‍ය ඇමතිකම් පවා දෙන රාජ්‍ය නායිකාවටත් ඇගේ ආණ්ඩුවටත් කරන නිග්‍රහය සුළු පටු නොවේ. මේ ගෞරව නාම අතුරින් ඔහුට අවසානයේදී අත්‍යන්තයෙන්ම ගැළපෙන්නේ ඔහුට වරෙක කී 'අංගුලිමාල' යන්න පමණකැයි කිව යුතුය. ආණ්ඩුවේ ඇමතිකම් ලබා වගකීමක් ගත් පුද්ගලයෙකු වන මර්වින් සිල්වා සිය චණ්ඩි පුතා විසින් කරන ලද වරද වසා ගැනීමට පෞද්ගලික මාධ්‍යවලට පරුෂ වචනයෙන් බැණ වදී. පෞද්ගලික අපහාසයට ද ලක් කරයි. ප්‍රසිද්ධ ස්ථානවල මෙවැනි නොපනත්කමක් ද බලය අයුතු ලෙස පාවිච්චි කිරීමත් ද සිදු වූ විට ඒවා යට ගසා හෙළි නොකොට සිටීම නිදහස් මාධ්‍යයකට කළ හැකි ක්‍රියාවක් ද? කළ යුතු ක්‍රියාවක් ද?

රටේ පෞද්ගලික මාධ්‍යයේ හැසිරීම ගැන අවලාද නඟන රාජ්‍ය මාධ්‍ය මෙම නොපනත්කම වසන් කිරීමට කරන්නාවූ ලජ්ජාසහගත ප්‍රයත්නය පැහැදිලිය. මර්වින් සිල්වා වැනි මාධ්‍ය ආයතනවලට කඩා වැදී චණ්ඩිකම් පෑවකුගේ තර්ජන නොතකා නිදහස් පෞද්ගලික මාධ්‍ය කළ මේ හෙළි දරව්ව මෙරට පොදු ජනතාවගේ මහත් ප්‍රශංසාවට ලක් වී තිබේ.

මර්වින් සිල්වා මෙවන් ක්‍රියා හෙළිකරන මාධ්‍ය ආයතනවලටත් මාධ්‍යවේදීන්ටත් නොසරුප් වචනයෙන් බැණ වැදී කළ අපහාසයට විරෝධය දක්වමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයත් ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමයත් සිය විරෝධය පළ කළේ එය නිදහස් මාධ්‍යයට කළ තර්ජනයක් බව පෙන්වා දෙමිනි.

දේශපාලන හයිය සියතට ගෙන බලපුළුවන්කාරකම් පෙන්වන මෙවැනි 'හයිකාර පුතුන්' සාක්කි තිබියදී අත් අඩංගුවට ගැනීමට කොන්ද කෙළින් තබාගෙන රාජකාරි කළ හැකි පොලිසියක් තිබිය යුතුය. රාජකාරියකට යවන පොලිස් නිලධාරීන්ට අවංකව සිය රාජකාරිය ඉටු කළ හැක්කේ ඉහළ නිලධාරීන් හරිහැටි රාජකාරිය කරන්නවුන් ආරක්ෂා කිරීමට පෙනී සිටියොත් පමණි. එසේ නැතිව ඔවුන් බිල්ලට දී සිය පුටු රැක ගැනීමේ පිළිවෙතක් ඇති කල්හි අවංක සේවයක් අපේක්ෂා කළ නොහැකිය.

සති කිහිපයකට පෙර ජනාධිපතිනිය රටේ ප්‍රචණ්ඩ ක්‍රියා සහ පාතාලය මෙල්ල කිරීම ගැන පොලස්පතිවරයාටත් පොලිසියටත් ලොකු ප්‍රශංසාවක් කර කටගත්තා පමණි.

නියෝජ්‍ය ඇමති පුත් මාලක සිල්වා සිද්ධිය පිළිබඳව මත්ද්‍රව්‍ය නාශක අංශයේ අධ්‍යක්ෂවරයා සිය කණ්ඩායමට රාජකාරියට බාධා කළ බව කියතත්, මේ පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි නැතැයි පොලිස්පතිවරයා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරයි. එසේ නම් සැකකරුට පොලිසිය ඇප දුන්නේ ඇයි? කවුරුත් නඟන ප්‍රශ්නය මෙයයි.

මාලක සිල්වා සිද්ධිය සම්බන්ධයෙන් පොලිසිය අපක්ෂපාතීව ක්‍රියා කරන්නේ කෙසේදැයි දැන් රටම බලා සිටී. පොලිස්පතිතුමනි පොලිසිය අපක්ෂපාතී රාජකාරියක නිරත වන බව රටට ඔප්පු කර පෙන්වන්න.